# නව කර්මාන්තයකට ප්‍රවේශයක්..........

# ශ්‍රී ලංකාවේ මල් සහ විසිතුරු පැළ කර්මාන්තය

මල් සහ විසිතුරු පැළ ඕනෑම සමාජයක, ඕනෑම තරාතිරමක පුද්ගලයකුගේ චිත්ත සන්තානය තුළ සෞන්දර්යාත්මක හැඟීම් ජනිත කරවීමට සමත් වේ. මානව ශිෂ්ඨාචාරයේ ආරම්භයේ සිටම විවිධාකාරයෙන් ක්‍රියාවට නැඟුණු මල් සහ විසිතුරු පැළ වගාව වාණිජත්වය මූල්කර ගනිමින් දේශීය සීමාවන් ඉක්මවා යමින් වර්තමානයේ ජාත්‍යන්තර තලයෙහි ඉතා ප්‍රචලිත කර්මාන්තයක් බවට පත්ව තිබේ. පුළුල් දෘෂ්ඨියකින් බලන විට, මල් සහ විසිතුරු පැළ වගාව උද්‍යාන බෝග වගාවේ අනු විෂයක් ලෙස හඳුන්වා දිය හැකිය. උද්‍යාන බෝග වගාව මූලික ලෙස ආහාර (Food) නිෂ්පාදනය හා පාරිසරික (Environment) සුන්දරත්වය ඇතිකිරීම යන අරමුණු දෙක යටතේ ක්‍රියාත්මක වේ. එහි දී, එළවළු වගාව හා පලතුරු වගාව ආහාර නිෂ්පාදන අරමුණ යටතට ගැනෙයි. පාරිසරික අරමුණු යටතට මල් හා විසිතුරු පැල වගාව මෙන්ම උද්‍යාන සැලසුම්කරණය යන විෂයයන් දෙක අයත් වේ. මෙහි දී අවධානය යොමුවන්නේ මල් සහ විසිතුරු පැල වගාව යන උප විෂය ක්ෂේත්‍රය කෙරෙහිය.

මල් සහ විසිතුරු පැල වගාව කර්මාන්තයක් ලෙස ගත් විට, එයට වගාව පමණක් අන්තර්ගත නොවන බව ආරම්භයේදීම සිහි තබා ගතයුතු කරුණකි. මෙයට වගාවේ සිට අලෙවිය දක්වා වන සෑම අංශයක්ම සම්බන්ධ වේ. මේ පිළිබඳව විවිධ අර්ථ දැක්වීම් පවතින අතර ඒ සියල්ල සාරාංශ කොට ගත් කළ මල් සහ විසිතුරු පැළ වගා කර්මාන්තය (Floriculture) යනු මල්, විසිතුරු පැළ, බල්බ හා තෘණ වර්ග ඇතුළු අනෙකුත් අලංකරණ අවශ්‍යතා හා පරිසර දූෂණය වැළැක්වීමට යොදා ගන්නා උද්‍යාන බෝග විශේෂයන්ගේ වගාව හා අලෙවිය (Floriculture refers to cultivating and trading of flower, ornamental plants, bulbs, sod or turf grass and other related horticultural specialties for ornamentel purposes and to protect the environment from pollution) ලෙස සරලව හැඳින්විය හැකිය. මේ යටතේ එන නිෂ්පාදන ලෙස කැපූ මල්, කැපූ අතු රිකිලි, බඳුන්ගත පැල, තවාන් පැල, රෝපන ද්‍රව්‍ය, වියළි මල් ආදිය වේ. මෙම තත්ත්වය ඉතා පැහැදිලිව පළමු රූප සටහන මඟින් ඉදිරිපත් කෙරේ. මෙහි දී, බඳුන්ගත පැල නැවත කොටස් දෙකකට බෙදෙන අතර එය මල් හටගන්නා පැල හා විසිතුරු පැල වශයෙනි. මේවා ස්ථානගත කරන ආකාරය අනුව නැවත ගෘහස්ථ හා එළිමහන් වශයෙන් වර්ග කිරීමක් පවතී.

කර්මාන්තයක් ලෙස ස්ථාපිතව නොපැවතිය ද, ඈත අතීතයේ සිටම මල් සහ විසිතුරු පැල වගාව ශ්‍රී ලාංකීය සමාජය තුළ මුල් බැසගෙන පැවති බවට සාධක ඓතිහාසික තොරතුරු වලින් අනාවරණය වේ. විවිධ ආගමික පුද - පූජා, සමාජ චාරිත්‍ර - චාරිත්‍ර සඳහා මෙන්ම රජවාසල මල් අවශ්‍යතා සඳහා ද වෙන් වූ මල්කරුවන් මෙන්ම ගම්මාන පිළිබඳව ද විවිධ ජනප්‍රවාද සහ පුරාවිද්‍යා සාක්ෂි පවතී. අනුරාධපුර, පොළොන්නරු රාජධානි සමයේ නගර නිර්මාණකරණයේ දී මල් හා විසිතුරු පැල වලින් සමන්විත උද්‍යාන සඳහා විශේෂ වැදගත්කමක් දී තිබේ. ඒ සඳහා කදිම නිදසුනක් වන්නේ මහමෙව්නා උයන හා සීගිරි ජල උද්‍යානයයි. එකළ සිටි රජවරු මල් සහ විසිතුරු පැල වගාව හා ඒවා ආරක්ෂා කිරීමෙහි වැදගත්කම පිළිබඳව මනා අවබෝධයකින් පසු වූ බව පැහැදිළි වෙයි.

කෙසේ වුව ද, ශ්‍රී ලංකාව බටහිර ජාතීන්ගේ ආක්‍රමණ වලට දිගින් දිගටම ලක්වීමත්, යටත් විජිතයක් බවට පත්වීමත් සමඟ මල් සහ විසිතුරු පැල වගාවෙහි ද නව කාල පරිච්ඡේදයක් ආරම්භ විය. විශේෂයෙන්, මෙකල විවිධ ඝර්ම කලාපීය හා සෞම්‍ය කලාපීය මල් හා විසිතුරු පැල දේශීය වගාවන්ට එක් වූ අතර ඉහළ පාන්තිකයන්ගේ විවිධ අවශ්‍යතාවයන් උදෙසා මෙන්ම ඔවුන්ගේ විනෝදාස්වාදය සඳහා මල් හා විසිතුරු පැල වගාව සිදු කෙරුණි. ධනවතුන්ගේ හා ප්‍රභූන්ගේ නිවාස අලංකරණය හා ගෙවතු අලංකරණය උදෙසා විදේශීය ශාක විශේෂයන් ද මෙරටට වැඩි වශයෙන් රැගෙන ඒමක් ද මෙකී කාල වකවානු තුළ සිදු වූ බව වාර්තා වේ. පශ්චාත් යටත් විජිත සමයේ රට තුළ සිදු වූ සමාජ ආර්ථික පරිවර්තනයත් සමඟ මල් සහ විසිතුරු පැල වගාව ද නැවුම් දිශාවකට යොමු විය. සමාජයේ ඉහළ යැයි සම්මතව තිබූ සමාජ ස්ථරයට අමතරව උගත් මධ්‍යම පාන්තික පිරිසක් ද මෙකී කාලවකවානු තුළ මතුවෙමින් පැවතුණි. මුලින් ඉහළ පාන්තිකයන්ගේ විනෝදාස්වාදය සඳහා පමණක් වෙන්ව තිබූ මල් සහ විසිතුරු පැල වගාව ක්‍රමිකව නව හඳුන්වාදීම් සමඟින් සමාජයේ සෙසු සමාජ ස්ථර කරාද යොමුවිය. නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල මෙය විශේෂයෙන් කැපී පෙනෙන්නකි.

මුලින් විනෝදාස්වාදය සඳහා පමණක්ම වෙන් වූ මල් සහ විසිතුරු පැල වගාව 1950 දශකයේ අවසානය වන විට ක්‍රමිකව වාණිජ මට්ටම දක්වා යොමුවීමක් දක්නට ලැබේ. 1970 පමණ වනවිට ශ්‍රී


**එන්.ජී.ජී. සමන්ත**


*පර්යේෂණ නිලධාරී*

කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය,

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**රූප සටහන අංක 01 :**

## මල් සහ විසිතුරු පැල වගාවේ සැකැස්ම




ලංකාව අපනයන වෙළෙඳ පොළට ප්‍රවේශ වුව ද, ලෝකයේ මල් අපනයනය කරන සෙසු රටවල් සමග තරඟකාරී මට්ටමෙන් කර්මාන්තය තුළ ක්‍රියා කිරීමේ හැකියාවක් නොතිබුණි. 1973-78 කාල වකවානුවෙහි ලෝකයේ ඇති වූ ඉන්ධන අර්බුදයත් සමග යුරෝපයේ බොහෝ පැල තවාන්වල පිරිවැය තත්ත්වයත් විශාල වශයෙන් ඉහළ නැඟුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ මල් සහ විසිතුරු පැල සඳහා ලෝක වෙළඳපොළෙහි පැවති ඉල්ලුම විශාල වශයෙන් වැඩි විය. මේ හේතුවෙන් දේශීය ආයෝජකයින් මෙන්ම විදේශීය ආයෝජකයින් බද්ධ වෙමින් ද වැඩි වශයෙන් මෙවැනි කර්මාන්ත තුළ ආයෝජනය කිරීමට පෙළඹුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය නව තාක්ෂණය, පැළෑටි වර්ග මෙන්ම සෑම අංශයකම සීඝ්‍ර දියුණුවක් 1980 - 90 දශකවල ඇතිවිය.

### මල් හා විසිතුරු පැල කර්මාන්තය හා සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති

කලින් කලට බලයට පත්වන විවිධ රජයන් කෘෂිකර්මයට සම්බන්ධ තම ජාතික ප්‍රතිපත්ති සැකසීමේ දී මෙම අංශය පිළිබඳව විශේෂ අවධානය යොමු කර තිබේ. ඒ පිළිබඳ මුල්ම සාක්ෂි හමුවන්නේ 1972-76 පස් අවුරුදු සංවර්ධන සැලැස්ම තුළිනි. සමාජවාදී රාජ්‍ය සංකල්පය මත පදනම් වෙමින් දේශීය කෘෂි ආර්ථිකය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් සැකසුනු මෙම ප්‍රතිපත්ති රාමුවෙහි මල් සහ විසිතුරු පැල වගාවෙහි සීඝ්‍ර වර්ධනයක් ලබාගත යුතු බව අවධාරණය කර තිබේ. 1969 වසරෙහි අපනයන අංශයට ප්‍රවේශ වූ මෙම කර්මාන්තය 1970 වසර වනවිට, වාර්ෂිකව රුපියල් තිස්දහසක පමණ විදේශ විනිමයක් උපයාගෙන තිබුණි. විශේෂයෙන්ම 1971 වසර වනවිට ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, බටහිර යුරෝපය හා ජපානය තුළින් සැලකිය යුතු ඉල්ලුමක් ශ්‍රී ලංකාවේ කැපූ මල් සඳහා පැවතුණි. මේ මත පදනම්ව ඒ වනවිට අපනයනය සඳහා මල් වැවීමට යොදාගත් අක්කර 15 ක පමණ බිම් ප්‍රමාණය 1976 දී අක්කර 170 දක්වා වැඩි කිරීමට සැලසුම් කරන ලදී. ඉන් වාර්ෂික කැපූ මල් නිෂ්පාදනය මිලියන 1.3 සිට මිලියන 14.5 ක මට්ටමක් දක්වා (1976 වන විට) වැඩි වනු ඇතැයි අපේක්ෂාව විය. මේ තුළින් රුපියල් මිලියන 15ක ආදායමක් (1976 වනවිට) ලැබෙනු ඇතැයි අපේක්ෂා කළ අතර ආර්ථික කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම පිළිබඳව වැඩි වැදගත්කමක් දැක් වූ මෙම පස් අවුරුදු සැලැස්ම තුළ කැපූ මල් අලෙවි කිරීම හා පිටරට යැවීම සඳහා රජයේ අලෙවි සංවිධානයක් පිහිටුවීමට යෝජනා කෙරුණි. එමෙන්ම, කර්මාන්තය ගැන විමසිලිමත් වීමට හා එහි අනාගත දියුණුව ගැන රජයට උපදෙස් දීමට වවන්නන්ගේ, අපනයනකරුවන්ගේ හා රජයේ දෙපාර්තමේන්තුවල නියෝජිතයන්ගෙන් සමන්විත වූ උපදේශක සංවිධානයක් ද පිහිටුවීමට යෝජනා විය.

ඉන් පසුව, 1977 වසරේ බලයට පත්වන රජය සිය 1978-82 පස් අවුරුදු කෘෂිකාර්මික සැලැස්ම යටතේ මල් හා විසිතුරු පැල කර්මාන්තයේ සංවර්ධනය

අරමුණු කර ගනිමින් ප්‍රතිපත්ති බොහොමයක් සැලසුම්කර තිබුණි. මෙහි දී විශේෂ අවධානය යොමුකර ඇත්තේ පෞද්ගලික අංශය මේ සඳහා වැඩි වශයෙන් දිරිගැන්වීමත්, විදේශීය නව තාක්ෂණය, බීජ වර්ග හා විශේෂඥ ඥානය වැඩි වශයෙන් දේශීය වගාවන් මෙන්ම වගා කරුවන් සමඟ බද්ධ කිරීමත් කෙරෙහිය. මෙම සැලැස්ම තුළ කැපූ මල් සඳහා පවතින විදේශ වෙළඳ පොළට අමතරව කැපූ අතු - රිකිලි (Foliage) වර්ග සඳහා ඇති විභවතාවය ද අවධාරණය කර තිබේ.

1978-82 ආංශික සැලැස්මෙහි දක්වන ආකාරයට 1972-76 පස් අවුරුදු සැලැස්මෙහි ඉලක්ක සපුරා ගැනීමට රජයට නොහැකි වූයේ හේතු කිහිපයක බලපෑම නිසාවෙනි. ඉහත දැක් වූ පරිදි එම සැලැස්ම අනුව මල් වගාව අක්කර 15 සිට 170 දක්වා ද, නිෂ්පාදනය මිලියන 1.3 සිට මිලියන 14.6 දක්වා ද, ඉහළ දැමිය යුතු විය. 1976 වනවිට රුපියල් මිලියන 15ක විදේශ විනිමය ආදායමක් බලාපොරොත්තු වූ අතර මෙකී ඉලක්කය සැපිරිය නොහැකි වීමට ප්‍රධාන හේතුව ලෙස දක්වා ඇත්තේ ලබාගත හැකි යෙදවුම් වලට සාපේක්ෂව ඉලක්කය ඉතා ඉහළ මට්ටමක පැවතීමයි. එමෙන්ම, සෙසු වගාවන් සමඟ සැසඳීමේ දී මල් හා විසිතුරු පැල වගාව තුළ යෙදවිය යුතු මූලික ප්‍රාග්ධනය ඉහළ මට්ටමක පවතී. මෙය දීර්ඝ කාලීන ආයෝජනයකි. ප්‍රතිලාභ බලාපොරොත්තුවෙන් යම් කාල පරාසයක් බලා සිටිය යුතුය. එමනිසා, මෙයට බලාපොරොත්තු වූ ආකාරයෙන් ග්‍රාමීය මට්ටමේ සහභාගීත්වයක් නොලැබුණි. ඊට දේශීය හෝ විදේශීය මූලයන්ගෙන් මූල්‍ය සහයෝගයක් ලැබිය යුතු විය. තව ද, මෙම කර්මාන්තයේ වර්ධනය හා ව්‍යාප්තිය රෝපන ද්‍රව්‍ය මත පදනම් වෙයි. අදාල කාල පරිච්ජේදය තුළ රාජකීය උද්භිද උද්‍යානයට අමතරව පෞද්ගලික අංශයට රෝපන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා සහයෝගයක්ද නොලැබුණි. එමෙන්ම, රජයේ ඉතා පහළ මිල ගණන් වලට රෝපන ද්‍රව්‍ය සැපයීම සිදු වූ අතර ඒ සඳහා ඉහළ ඉල්ලුමක් පැවතුණි. එය සැපිරීමට රාජකීය උද්භිද උද්‍යානයට හැකියාවක් හා පහසුකම් ද ප්‍රමාණවත් පරිදි නොවිය. මේ හේතුවෙන් රෝපන ද්‍රව්‍ය ලබාගැනීම සම්බන්ධ ගැටළු මතුවිය. මෙකී කාලය තුළ රෝපන ද්‍රව්‍ය, මව් ශාක ආදිය ආනයනය සපුරා තහනම් වී තිබුණි. මෙකී හේතු අපේක්ෂිත ඉලක්ක වෙත ළඟාවීමේ දී බාධාවක් බවට පත් විය.

කෙසේ වුව ද, 1978-82 පස් අවුරුදු කෘෂිකාර්මික සැලැස්මෙහි ඉලක්කය වූයේ 1977 වනවිට අක්කර 32ක් තුළ ව්‍යාප්තව පැවති වාණිජ මට්ටමේ මල් හා විසිතුරු පැල වගාව 1982 වසර වනවිට අක්කර 65 දක්වා ව්‍යාප්ත කිරීමයි. මේ තුළින් 1977 මිලියනයක් වූ මල් නිෂ්පාදනය 1982 වනවිට මිලියන 2.4 ක් දක්වා වැඩි කරගැනීමට අපේක්ෂා කෙරුණි. 1980 පමණ වනවිට දේශීය වෙළඳපොළ සංතෘප්ත මට්ටමට පැමිණෙනු ඇති බවත්, ඉන් අනතුරුව විදේශ වෙළඳපොළ ශීඝ්‍රයෙන් වර්ධනය වීමක් ද අපේක්ෂාව විය. මෙමඟින් 1977 දී රු. මිලියන 2.7 වූ විදේශ විනිමය, 1982 දී රු. මිලියන 4.8 දක්වා වර්ධනය වනු ඇති බවට ඉලක්ක කර තිබුණි. මෙකී ඉලක්ක වෙත ළඟාවීම සඳහා මල් හා විසිතුරු පැල වගාවට සම්බන්ධව විකල්ප ක්‍රමෝපායයන් කිහිපයක් 1978-82 පස් අවුරුදු කෘෂිකර්ම සැලැස්මෙන් යෝජනා විය. මෙහි දී, පෞද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම ඉතා අත්‍යාවශ්‍ය කරුණක් බව පෙන්වා දී තිබේ. ග්‍රාමීය මට්ටමේ කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ට අවශ්‍ය රෝපන ද්‍රව්‍ය ලබාගැනීමේ හැකියාව පහසුවන අයුරින් වගා විභවතාවය ඉහළ මට්ටමේ පවතින ප්‍රදේශයන්හි වගාව ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රරෝහණය හා රෝපන ද්‍රව්‍ය බෝ කිරීමේ හැකියාවක් ඇති මහා පරිමාණ නිෂ්පාදකයින් බිහිකළ යුතු බව මෙමඟින් දක්වයි. තව ද, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින්ට අවශ්‍ය රෝපන ද්‍රව්‍ය හිඟය මග හැරෙනු ඇත. එසේම පුහුණු, ව්‍යාප්ති සේවා, පොහොර හා අනෙකුත් යෙදවුම් වර්ග ඉතා පහසුවෙන් වවන්නන්ට ලබා ගැනීමේ පහසුකම් වර්ධනය කළ යුතු බව වැඩිදුරටත් සඳහන් වේ. එමෙන්ම, නිෂ්පාදන අපනයනයේ දී අපනයන පාලනය හා විනිමය පාලන දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුගමනය කරන ක්‍රියාමාර්ග සරල විය යුතු බව ද සඳහන් කොට තිබේ. තව ද, කර්මාන්තය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති ඉතා වැදගත් යෝජනාවක් වන්නේ මල් හා විසිතුරු පැල හා සම්බන්ධ අලෙවි හා ප්‍රදර්ශන මධ්‍යස්ථානයක් නිදහස් චතුරශ්‍රය අසල පිහිටුවීම සඳහා වූ යෝජනාවයි.

1994 වසරේ බලයට පත් වූ පොදුජන එක්සත් පෙරමුණු රජයේ කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය මඟින් 1995 වසරේ එළිදැක් වූ කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් කටයුතු පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ අපනයන අංශයෙහි මල් හා විසිතුරු පැල කර්මාන්තය දැක් වූ සීඝ්‍ර වර්ධනය පිළිබඳවත්, එහි අනාගත විභවතාවය පිළිබඳවත් අවධානය යොමුකර තිබේ. මේ වනවිට, කැපූ මල් අංශය අභිබවා යමින් අපනයන වෙළඳපොළ තුළ සජීවී පැල හා කැපූ අතු කැබලි/ පත්‍ර ප්‍රමුඛස්ථානයට පත්ව තිබේ. කෙසේ වුව ද, වැඩි දියුණු කිරීමේ අවස්ථාවන් මද වීමෙන් කැපූ මල් අංශයේ ආදායම ස්ථාවර මට්ටමක රැඳී පවතී. මෙනිසා, මෙකී ප්‍රතිපත්ති රාමුව තුළ අපනයන ද්‍රව්‍ය විවිධාංගීකරණය හා යුරෝපයේ මෙන්ම උතුරු අර්ධද්වීපයේ රටවල මල් හා ශාක නිෂ්පාදන වියදම සීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් එහි වාසිය ලබාගැනීමේ හැකියාව පිළිබඳ සැලකිලිමත් විය යුතු බව දක්වා තිබේ. ඒ සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග කිහිපයක් ද යෝජනා අතර පවතී.

මේ යටතේ ප්‍රථමයෙන්ම, ඒ වනවිට පැවති මල් සහ විසිතුරු පැල ප්‍රභේද සංඛ්‍යාව තවදුරටත් වැඩි කිරීම සඳහා විදේශීය ප්‍රභේද හඳුන්වාදීම, වරණය හා අභිජනනය පිළිබඳ කඩිනම් අවධානය යොමුකළ යුතු බව සඳහන් කරයි. ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් පුළුල් කළ යුතු බව දැඩිව අවධාරණය කර ඇති අතර ජෛව තාක්ෂණික උපාය මාර්ග යොදා ගැනීම පිළිබඳව විශේෂ අවධානය යොමුකර තිබේ. බීජ හා පැල වර්ග ප්‍රමාණවත් පරිදි සැපයීම සඳහා පෞද්ගලික අංශය දිරි ගැන්විය යුතු බවත්, කේන්ද්‍රීය වශයෙන් විශාල ගොවිපලවල් පිහිටුවා

ඒ තුළින් සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන් අනුබද්ධිත වගාකරුවන් ලෙස බාහිර වශයෙන් පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳවත් අවධානය යොමුකර තිබේ. ඒ සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාද වී ගෙවීමේ පදනමක් හා බදු සහන මත ලබාදීම පිළිබඳව සැලකිලිමත් වන බව ද දක්වයි. විසිතුරු පැල අංශයෙහි සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති පැල වර්ග වියලා මිලෙන් වැඩි නිෂ්පාදන සැකසීමේ හැකියාව පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කෙරේ. 1984 දී ප්‍රකාශිත විද්‍යා ප්‍රතිපත්ති වාර්තාව මගින් නිර්දේශ කර ඇති පරිදි මල් හා විසිතුරු පැල පිළිබඳ ලේකම් කාර්යාලයක් හෝ ජෛව තාක්ෂණ විද්‍යාගාරයක් පිහිටුවීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇති අතර අනාගතයේ දී උද්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුවක් පිහිටුවීමේ අපේක්ෂාවක් පවතින බවත්, එමගින් මල් හා විසිතුරු පැල වගාව මෙන්ම සමස්ත උද්‍යාන විද්‍යා ක්ෂේත්‍රයටම ඉතා ඉහළ සේවයක් ලබා ගත හැකි බවත් වැඩි දුරටත් සඳහන් ය.

2002 වසරේ බලයට පත්වන එක්සත් ජාතික පක්ෂ රජය සැකසූ 2003-2010 සත් අවුරුදු කෘෂිකාර්මික සැලැස්ම යටතේ "දේශීය හා විදේශීය ඉල්ලුමක් ඇති මල්, අතු හා පැලැටි වර්ග වගා කිරීම සඳහා උනන්දු කරවන අතර මේ රටේ පහසුවෙන් වගා කළ හැකි හා වැවෙන අලංකාර මල්, අතු හා පැලැටි වලට දේශීය හා විදේශීය වෙළඳපොළක් ඇතිකර ගැනීමට කටයුතු කිරීමත්, ඒ සඳහා අවශ්‍ය ආධාර ලබාදීමත්, මල් අලෙවිය, ප්‍රවාහනය හා රස්කර තබා ගැනීමට අවශ්‍ය පහසුකම් ව්‍යාප්ත කිරීමත්, මල් සහ විසිතුරු පැල පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" ලෙස අර්ථ දක්වා තිබුණි. එමෙන්ම, එකී ජාතික ප්‍රතිපත්තිය තුළ මල් හා විසිතුරු පැල වගාවට සම්බන්ධ සෑම අංශයක්ම, විශේෂයෙන්ම තාක්ෂණය, අලෙවිය, පර්යේෂණ යන අංශයන්හි වර්ධනයක් ඇතිකළ යුතු බව සහ විවිධ මල්, කොළ හා පැලැටි නිෂ්පාදනය කරන කලාප හා ගම්මාන ඇති කළ යුතු බව ද අවධාරණය කර තිබුණි.

2004 වසරේ බලයට පත් වූ වත්මන් රජයේ 2005-2009 පස් අවුරුදු කෘෂිකාර්මික සැලැස්ම යටතේ ද මල් සහ විසිතුරු පැල කර්මාන්තය ඉහළ වර්ධනයක් පෙන්නුම් කර ඇති බවත්, තවදුරටත් වර්ධනය කිරීමේ ඉහළ විභවතාවයක් ද පවතින බවත්, අවධාරණය කර තිබේ. නිෂ්පාදනයන් හි ගුණත්වය හා ඒකක ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම මෙවැනි තරඟකාරී කර්මාන්තයක දී ඉතා අත්‍යාවශ්‍ය කරුණක් බව ද එහි සඳහන් වේ. ජාතික උද්භිද උද්‍යානය මගින් ක්‍රියාත්මක කරන වැඩ සටහන් වලට අමතරව දිගු කාලයක සිට දැඩි අවශ්‍යතාවයක්ව පැවති මල් හා විසිතුරු පැල වගාව සහ උද්‍යාන අලංකරණය පිළිබඳ පර්යේෂණ හා පුහුණු කිරීමේ ජාතික ආයතනයක් (National Floriculture and Landscape Research and Training Institute) පිහිටුවන බව වැඩිදුරටත් සඳහන් කොට තිබේ.

මේ අනුව, ඉතා පැහැදිලි වන්නේ කලින් කලට බලයට පවත්වන රජයන් තම කෘෂිකාර්මික සැලසුම් වල දී, මල් හා විසිතුරු පැල වගා කර්මාන්තය සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමුකර ඇති බවයි. එමෙන්ම, ඒ සෑම ප්‍රතිපත්ති රාමුවකින්ම එකම ආකාරයේ ගැටළු සහගත තත්ත්වයන් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා යෝජනා රැසක් ඉදිරිපත්ව තිබේ. යම් යම් යෝජනා දිගින් දිගටම පැවතිය ද, මේ දක්වා ඉටු නොවී ඇති බව ද පැහැදිලිය. විශේෂයෙන්ම, අලෙවි හා ප්‍රදර්ශන මධ්‍යස්ථාන, පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන ආදිය ඊට කදිම නිදසුන් කිහිපයකි. තවත් පැහැදිලි වන කරුණක් වන්නේ මල් හා විසිතුරු පැල වගා කර්මාන්තයේ ආරම්භක අවධියේ සිටම පවතින ගැටළු මේ දක්වාම ක්‍රමිකව පැවතෙන බවයි. වෙනස වන්නේ එහි පරාසය කෙතරම් පුළුල් හෝ පටු ද යන්න පමණකි.

## මල් සහ විසිතුරු පැල වගාවෙහි වත්මන් තත්ත්වය

ශ්‍රී ලංකාව තුළ මල් සහ විසිතුරු පැල වවන්නන් මූලික වශයෙන් කොටස් තුනකට බෙදා වෙන් කළ හැකිය. එනම්

i මහා පරිමාණ වගාකරුවන්
ii මධ්‍ය පරිමාණ වගාකරුවන්
iii සුළු පරිමාණ ග්‍රාමීය මට්ටමේ වගාකරුවන්

වශයෙනි.

වර්තමානය වන විට, ශ්‍රී ලංකාවේ වාණිජ මට්ටමේ මල් සහ විසිතුරු පැල වගාව සඳහා යොමු වී ඇති භූමි ප්‍රමාණය කොතරම්ද යන්න පිළිබඳව සියයට සියයක නිශ්චිත තොරතුරු ලබාගැනීම ඉතා අපහසු කරුණක් බවට පත්ව තිබේ. 1997 වසරේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කරන ලද සමීක්ෂණ වාර්තාවකට අනුව, ඒ වනවිට අක්කර 720 ක බිම් ප්‍රමාණයක් වාණිජ මට්ටමේ මල් සහ විසිතුරු පැල වගාව සඳහා වෙන් වී තිබූ බව සඳහන් වේ. මේ වනවිට එම තත්ත්වය වෙනස් වී පැවතිය හැකි අතර ඒ පිළිබඳ නිශ්චිත තොරතුරු ලබාගැනීම අසීරු කටයුත්තකි.

ශ්‍රී ලාංකීය මල් හා විසිතුරු පැල කර්මාන්තයේ වත්මන් තත්ත්වය පිළිබඳව සලකා බැලීමේදී ඒ යටතේ එන ප්‍රධාන නිෂ්පාදන කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

i. කැපූ මල් -Cut flower
ii. විසිතුරු පැල – Ornamental plant
iii. කැපූ අතු රිකිලි - Cut foliage
iv. කැපූ කොළ - Cut leaves
v. බල්බ, රෛසෝම, ආකන්ද යනාදියයි.

කැපූ මල් කර්මාන්තය පිළිබඳව සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව තුළ සෞම්‍ය කලාපීය හා ඝර්ම කලාපීය යන වර්ග දෙකම වගා කිරීමේ හැකියාව පවතී.

### සෞම්‍ය කලාපීය කැපූ මල්

සෞම්‍ය කලාපීය මල් වර්ග අතරට කානේෂන්, රෝස, ස්ටැටිස්, ලිලී, ක්‍රිසැන්තිමම්, අල්ස්ට්‍රෙස්ටෙරියා,

ජිප්සොෆිලා සහ ජර්බෙරා ආදිය අයත් වේ. ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ උස් බිම්වල සෞම්‍ය දේශගුණික තත්ත්වයන් මෙම වගාවන්ට හිතකර පරිසරයක් සකසා දෙයි. දේශීය හා විදේශීය වෙළඳපොළවල් සඳහා නිෂ්පාදන ඉදිරිපත් කෙරෙන අතර වැඩිපුරම රෝස හා කානේෂන් යන වගාවන් අපනයන වෙළඳපොළ අභිමුඛ කරගෙනම නිෂ්පාදන සිදු වේ. මෙහි දී විශේෂයෙන්ම, කානේෂන් වගාව පූර්ණ වශයෙන් විදේශීය රෝපන ද්‍රව්‍ය මත පදනම්ව ඉහළ තාක්ෂණික ක්‍රමෝපායයන් යටතේ සිදුවේ. එමෙන්ම, අපනයන වෙළඳපොළ අවශ්‍යතාවයන් කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කරයි. මෙහි දී, නිෂ්පාදනවල ගුණත්වය ඉහළ මට්ටමකින් පැවතිය යුතු බැවින් පූර්ණ පාලිත තත්ත්වයන් යටතේ වගාවන් සිදු වේ. පෞද්ගලික අංශයේ මහා පරිමාණ නිෂ්පාදකයින් මෙහි දී ප්‍රමුඛත්වය ගන්නා අතර මේ වනවිට හෙක්ටයාර් දහයකට වැඩි ප්‍රමාණයක් පූර්ණ පාලිත තත්ත්වයන් යටතේ වගාව සඳහා වෙන්වී ඇති බවට තොරතුරු පවතී.

කානේෂන් වගාවට අමතරව රෝස වගාව ද ඉහළ වැදගත් කමකින් යුතු වේ. මේ සඳහා දේශීය හා විදේශීය වශයෙන් ඉහළ ඉල්ලුමක් ද පවතී. අපනයන වෙළඳපොළ අරමුණු කරගත්තා නිෂ්පාදන ප්‍රධාන ලෙසම සෙවනාගාර තුළ පූර්ණ පාලිත තත්ත්වයන් යටතේ වගා කටයුතු සිදුවන අතර ඒ සඳහා ඉහළ විශේෂඥ ඥානයක්ද තිබිය යුතුය. රතු රෝස හා කහ රෝස වර්ග සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර හෙක්ටයාර් 2-4 අතර ප්‍රමාණයක් පාලිත තත්ත්වයන් යටතේ වගාව සඳහා වෙන්ව තිබේ. රෝස මල් සඳහා දේශිය වෙළඳපොළ තුළ පවතින ඉල්ලුම ද, ඉහළ මට්ටමක පවතින අතර එකී ඉල්ලුම සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන් විසින් සපුරාලයි. විශේෂයෙන්ම මංගල උත්සව, ආදරවන්තයින්ගේ දිනය වැනි සුවිශේෂී දිනයන්හි දී රෝස මල් සඳහා පවතින ඉල්ලුම වැඩි වීමක් දක්නට ලැබෙයි.

## ඝර්ම කලාපීය කැපූ මල්

ශ්‍රී ලංකාව ස්වභාවයෙන්ම ඝර්ම කලාපීය රටක් වශයෙන් සැලකෙන අතර ඇන්තූරියම් හා ඕකිඩ් ඝර්ම කලාපීය මල් අතර ඉතා වැදගත්කමක් උසුලයි. විශේෂයෙන්ම, ඇන්තූරියම් සඳහා දේශීය වශයෙන් ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. ඕකිඩ් හා ඇන්තූරියම් වගාව සඳහා බස්නාහිර පළාත දේශගුණික අතින් වැඩි වැදගත්කමක් උසුලයි. පවත්නා දත්තයන්ට අනුව වාර්ෂිකව ඇන්තූරියම් මල් මිලියන තුනක පමණ නිෂ්පාදනයක් සිදුවන අතර ඉන් වැඩි ප්‍රමාණයක් දේශීය අවශ්‍යතාවයන් සඳහා වෙන් වේ. මෙම වගාව මේ වනවිට ග්‍රාමීය, නාගරික වශයෙන් සෑම අංශයකම විසිරී පවතින අතර ගෘහස්ථව ද විශාල වශයෙන් වගාව සිදු කෙරෙයි. අපනයන තත්ත්වයේ වගාවන් සෙවන දැල් හෝ පොලිතින් ගෘහ තුළ පාලිත තත්ත්වයෙන් සිදුවන අතර දේශීය වෙළඳපොළ ඉලක්ක කරගත් වගාවන් වෙනත් විවිධ ස්වාභාවික සෙවන ක්‍රම උපයෝගී කර ගනිමින් සිදුකරයි. කෙසේ වුව ද, දේශීය වෙළඳපොළ අභිමුඛ කර ගනිමින් මල් වල ගුණත්වය පිළිබඳව වැඩි සැලකිල්ලක් නොදක්වා වගා කිරීම නිසා ලබාගත හැකි මිල පහළ මට්ටමක පැවතීමට හේතු වී තිබේ. ඇන්තූරියම් සඳහා ඉහළ ඉල්ලුමක් දේශීය වශයෙන් මල් ශාලා වලින් හා විවිධ සැරසිලි අවශ්‍යතා යටතේ පවතී. මේ වනවිට, ඇන්තූරියම් වගාව සඳහා අවම වශයෙන් හෙක්ටයාර් 10-12 අතර ප්‍රමාණයක් වෙන්ව ඇති බව විවිධ වාර්තාවන් හි සඳහන් වේ.

ඇන්තූරියම් වලට අමතරව ඝර්ම කලාපීය මල් යටතේ ඉහළ වැදගත්කමක් උසුලන්නේ ඕකිඩ් වගාවයි. මෙය උණුසුම් වියළි දේශගුණික තත්ත්වයන් යටතේ ඉතා හොඳින් වගා කළහැකි අතර ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත ඒ සඳහා වඩාත් සුදුසු වේ. ඕකිඩ් වගාව පිළිබඳව පෞද්ගලික අංශය වැඩි රුචිකත්වයක් දක්වන අතර ඔවුන්ගේ මෙහෙයවීම් යටතේ විවිධ සංවිධාන හා සංගම් මඟින් වගා ව්‍යාප්තිය හා උපදේශන සේවා ආදිය සපයා දෙයි. ඒ සඳහා එක් නිදසුනක් වන්නේ ලංකා උඩවැඩියා සංගමයයි. අපනයන වෙළඳපොළ අභිමුඛ කරගත් නිෂ්පාදන පාලිත තත්ත්වයන් යටතේ වගා වන අතර එයින් ඉහළ ගුණාත්මයෙන් යුතු නිෂ්පාදනයක් ලබාගැනීම අපේක්ෂා කෙරේ.

මෙම වර්ගයන්ට අමතරව, ඝරම කලාපීය මල් යටතේ හෙලිකෝනියා, ජින්ජර් වැනි මල් වර්ග ද අපනයන වෙළඳපොළ වෙත සැපයීමක් දක්නට ලැබේ.

## විසිතුරු පැල

විසිතුරු පැල ප්‍රධාන ලෙස කොටස් දෙකකට බෙදෙන අතර ඒ මල් සහිත හා මල් නොමැති වශයෙනි. ශ්‍රී ලංකාව මෙම දෙවර්ගයේම මුල් ඇද්ද වූ අතු රිකිලි නිෂ්පාදනයෙහි යෙදී සිටී. දේශීය හා විදේශීය වශයෙන් ඉහළ ඉල්ලුමක් විසිතුරු පැල සඳහා පවතින අතර නාගරික උද්‍යාන අලංකරණ අංශයෙහි මෙය කැපී පෙනේ. දැනට ශ්‍රී ලංකාව තුළ වැඩි වශයෙන් නිපදවෙන විසිතුරු පැල වර්ග නම් *ඩ්‍රැකේනා (Dracaena) වර්ග, ඇග්ලෙනිමා (Aglonema), ක්‍රෝටන් (Croton), එක්සෝරා (Ixora), ගාර්ඩනියා (Gardenia), පොලිසිනා (Polyscina), සෙෆ්ලෙරා (Schefflera),* යනා දී වර්ගයන් වේ.

## කැපූ කොළ හා අතු - රිකිලි

ශ්‍රී ලංකාවේ මල් හා විසිතුරු පැල අපනයන අංශයේ ඉහළම ආංශික වැදගත්කම දරන්නේ කැපූ කොළ හා අතු - රිකිලි නිෂ්පාදන අංශයයි. විශේෂයෙන්ම 1980 දශකයේ මුල් භාගයේ දී කැපූ මල් සඳහා පැවති ඉහළ ප්‍රමුඛතාවය ක්‍රමයෙන් අඩුවෙමින් වර්තමානයේ මෙම අංශය ප්‍රමුඛතම අංශය බවට පත්ව තිබේ. පෞද්ගලික අංශයේ මහා පරිමාණ නිෂ්පාදකයෝ මෙකී අංශය තුළ ආයෝජන කටයුතු සඳහා ඉහළ නැඹුරුවක් දක්වති. දැනට ප්‍රමුඛ ගණයෙහිලා සැලකෙන ප්‍රධාන නිෂ්පාදන වන්නේ *ඇග්ලඕනිමා (Aglaonima), පාල්ම් (Palm), ක්‍රෝටන් (Croton), කෝර්ඩිලයින් වර්ග (Cordiline), ඩ්‍රැකේනා*

*(Dracaena)*, *කැරියෝටා (Cariota)*, *පෝතොස් (Pothos)*, *මිස්කැන්තස් (Miscanyhus)* යනාදියයි.

ඉහත නිෂ්පාදන වලට අමතරව ප්‍රජනන ද්‍රව්‍ය වශයෙන් ගැනෙන බල්බ, ආකන්ද, කෝම සහ රෛසෝම යනාදිය ද දේශීය වශයෙන් නිෂ්පාදනය වන අතර අපනයන වෙළඳපොළට ද සුළු වශයෙන් ඉදිරිපත් කෙරේ.

මල් සහ විසිතුරු පැළ කර්මාන්තයේ වෙළඳපොළ සම්බන්ධයෙන් සළකා බැලීමේදී එය කොටස් දෙකක් යටතේ සාකච්ඡා කළ හැකිය. එනම්

i. දේශීය වෙළඳපොළ
ii. විදේශීය (ආනයන හා අපනයන) වෙළඳපොළ

වශයෙනි

ප්‍රධාන ලෙසම දේශීය වෙළඳපොළ සැපයුම් පාර්ශවය වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් ය. ඉල්ලුම් පාර්ශවය ප්‍රධාන ලෙසම නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ වලින් වැඩි වශයෙන් නියෝජනය වේ. දේශීය ඉහළ හා මධ්‍යම පාන්තික කාන්තාවන් මල් හා විසිතුරු පැල වගාව කෙරෙහි දක්වන උනන්දුව, දේශීය ඉල්ලුම තුළ විශේෂයෙන් කැපී පෙනෙයි. තව ද, නාගරික හා අර්ධ නාගරික කලාපවල ඉඩම් මිල ගණන් සීඝ්‍ර ලෙස වැඩි වීමත් සමඟ නිවාස අවශ්‍යතා සඳහා වෙන්වන භූමි ප්‍රමාණයන් කුඩා වී තිබේ. පවත්නා කුඩා බිම් ප්‍රමාණය ඉතා අලංකාරව පවත්වා ගැනීමේ අරමුණ මත වැඩි වශයෙන් මල් හා විසිතුරු පැල කෙරෙහි යොමුවීමක් දැකිය හැකිය. මල් හා විසිතුරු පැල සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් දේශීය වශයෙන් පවතින බව නැවත සඳහන් කළ යුතුය. ගොඩනැගිලි අභ්‍යන්තර හා බාහිර අලංකරණය සඳහා විශේෂයෙන්ම විසිතුරු පැල යොදා ගැනීම ද, දක්නට ලැබෙන තවත් කරුණකි. ඒ සම්බන්ධව සේවා සපයන වෙනම ආයතන හා පුද්ගලයින් ද බිහිවී සිටී. එය වර්තමානයේ ඉහළ ආදායමක් ලැබිය හැකි ලාභදායී ව්‍යාපාරයක් බවට පත්ව තිබේ. විශේෂයෙන්ම, සංචාරක ව්‍යාපාරය හා බද්ධව ක්‍රියාත්මක වන හෝටල්, නිවාඩු නිකේතන, සංචාරක බංගලා ආදියෙහි උද්‍යාන අලංකරණය හා අභ්‍යන්තර අලංකරණය සඳහා විසිතුරු පැල සම්බන්ධයෙන් ඉහළ ඉල්ලුමක් පවතී.

මල් හා විසිතුරු පැල කර්මාන්තයට අයත් නිෂ්පාදන අතරින් දේශියව වැඩි වශයෙන් ඉල්ලුම ව්‍යාප්තව ඇත්තේ කැපූ මල් හා සජීවී පැල නිෂ්පාදන සඳහා වන අතර කැපූ කොළ හා අතු රිකිලි ඊට අඩු මට්ටමක පවතී. කැපූ මල් ප්‍රධාන වශයෙන්ම වගා කෙරෙන්නේ නුවරඑළිය හා බදුල්ල දිසත්‍රික්කයන් හි වන අතර විවිධ ප්‍රවාහන මාධ්‍ය ඔස්සේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම නිෂ්පාදන අලෙවියක් සිදුවෙයි. වැඩිම නිෂ්පාදන ප්‍රමාණයක් කොළඹ හා අවට ප්‍රදේශවල අලෙවි කෙරේ. ප්‍රධාන පෙළේ මල් ශාලා හරහා මෙකී අලෙවිය සිදුවන අතර ඒ සඳහා මල් සපයන අතරමැදි ව්‍යාපාරික පිරිසක් ද හඳුනාගත හැකිය. දේශීය වශයෙන් කැපූ මල් සඳහා ඉල්ලුමක් ඇතිවන්නේ මංගල්‍ය හා අවමංගල්‍ය අවශ්‍යතා, විවිධ සැරසිලි උත්සව, විවිධ ආගමික පුද - පූජා හා සුවිශේෂී දිනයන්හි දී භාවිතා කිරීම යන කරුණු කාරණා වෙනුවෙනි. වර්තමානය වනවිට, මල් පාරිභෝජන නැඹුරුතාවය නැවුම් දිශාවකට යොමුවීමක් දක්නට ලැබේ. යුරෝපය හා ජපානය වැනි රටවල පවත්නා ආකාරයේ ජීවිතයේ විවිධ අවස්ථාවන් සඳහා මල් භාවිතයන්ට යොමු වීමක් පවතී. විශේෂයෙන්ම විවාහ සැමරුම්, උපන්දින, අළුත් දරුවන් බිහිවීම ආදී අවස්ථාවන් සඳහා මල් භාවිතාවට ක්‍රමයෙන් නැඹුරුවීමක් දක්නට ලැබේ. එය දේශීය කැපූ මල් ව්‍යාපාරය නව දිශාවකට යොමුවීමේ ලක්ෂණ පෙන්නුම් කරන්නකි.

පෙර සඳහන් කළ ආකාරයට දේශිය සැපයුම් පාර්ශවය සම්පූර්ණයෙන්ම පාහේ නියෝජනය වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන්ගෙනි. මෙම පිරිස අඩු පිරිවැය ක්‍රම යටතේ පහළ තාක්ෂණික ක්‍රමෝපායයන් වැඩි වශයෙන් යොදා ගනිමින් නිෂ්පාදන කටයුතු සිදු කරන බැවින් නිෂ්පාදන ගුණත්වය බොහෝ නිෂ්පාදනවල පහළ මට්ටමක පවතින බව පෙනේ. කෙසේ වෙතත්, දේශීය ආර්ථිකයට මෙයින් සිදුවන දායකත්වය ඉහළ මට්ටමක පවතින බව සඳහන් කළ යුතුය. වර්තමාන ගණනය කිරීම් වලට අනුව අඩුම වශයෙන් පුද්ගලයින් 5000 ක් වත් මෙම ක්ෂේත්‍රයේ ඍජු හා වක්‍ර රැකියා මාර්ගවල යෙදෙන බව ප්‍රකට කරුණකි. එය ග්‍රාමීය හා අර්ධ නාගරික සේවා නියුක්තිය ඉහළ නැංවීමට මහත් පිටුවහලක් ද වේ. අනෙක් අතින් සාම්ප්‍රදායික කෘෂිකර්මයෙන් ඉවත්වීමට මාන බලන දේශීය තරුණ පරම්පරාවට හා කාන්තාවන් ආකර්ශනය කරගැනීමට සමත් ව්‍යාපාරයක් වීම ද ඉතා වැදගත් වූවකි.

දේශීය මල්පැල හා විසිතුරු පැල අලෙවිය ප්‍රධාන ලෙසම නාගරික ප්‍රදේශවල පවත්වන පොළ හා ප්‍රදර්ශන මඟින් සිදු වේ. ප්‍රධාන අලෙවි මධ්‍යස්ථානයක් ලෙස සැළකිය හැකි විහාරමහා දේවි උද්‍යානයෙහි සෑම සති අන්තයකම මෙන් විවිධ මල් සංගම්, සමිති හා සංවිධාන මඟින් මල් ප්‍රදර්ශන හා අලෙවි කටයුතු සිදු කරනු ලබයි. ඒ හා සමානවම කොළඹින් බැහැර ප්‍රදේශ වල ද, විවිධ ප්‍රදර්ශන හා ප්‍රසිද්ධ ස්ථානවල හා සති පොළ වැනි ස්ථාන වල දී මල් හා සම්බන්ධ අලෙවි කටයුතු සිදුවෙයි.

දේශීය වෙළඳපොළ පෙරටු කොටගත් සුළු හා මධ්‍ය පරිමාණ බොහෝ නිෂ්පාදකයින් විවිධ අරමුණු පෙරදැරිව විවිධ සමිති හා සංවිධාන යටතේ සංවිධානය වී සිටී. මේ තුළින් අලෙවිය, තාක්ෂණික දැනුම හා අත්දැකීම් හුවමාරුව සඳහා අවස්ථාවන් ජනිත වී තිබේ. එවැනි සමහර සංවිධාන දේශීය වෙළඳපොළ අභිබවා යමින් අපනයන වෙළඳපොළ දක්වා වර්ධනය වීමේ අරමුණු සහිතව ක්‍රියාත්මක වන අතර එහි දී විවිධ දුෂ්කරතා මතුවී ඇති බව දැකිය හැකිය. මෙහි දී රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (පළාත් හා මධ්‍යම), සමෘද්ධි වැඩසටහන, කුඩා ව්‍යාපාර සංවර්ධන වැඩසටහන ආදී විවිධ රාජ්‍ය මට්ටමේ ව්‍යාපෘති මෙන්ම රාජ්‍ය නොවන විවිධ සංවිධාන ස්වයං රැකියා මට්ටමෙන් හා කුඩා ව්‍යාපාර මට්ටමෙන් මල් හා විසිතුරු පැල වගාව සඳහා ආධාර, අනුබල දෙමින්

කර්මාන්තයේ සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාකරන බව පැහැදිලි කරුණකි.

## අපනයන වෙළඳපොළ

මල් සහ විසිතුරු පැළ වගාවෙහි අපනයන වෙළඳපොළ අංශය ආර්ථික වශයෙන් සලකා බැලීමේ දී සුවිශේෂී වැදගත්කමකින් යුක්තය. වාර්ෂිකව සැලකිය යුතු මට්ටමේ විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළට ගෙන ඒමට එමඟින් හැකියාව ලැබ තිබේ. දේශීය මහා පරිමාණ වගාකරුවන් මූලික වශයෙන් අපනයන වෙළඳපොළ සමඟ සෘජුව සම්බන්ධ වන අතර බොහෝ දුරට ඔවුන් විදේශීය සමාගම් සමඟ හෝ පුද්ගලයින් සමඟ සෘජු සම්බන්ධතා පවත්වාගෙන යයි. මෙමඟින් වෙළඳපොළ සුරක්ෂිතතාව ඇති කරගෙන තිබේ. විදේශ වෙළඳපොළ සඳහා නිෂ්පාදන ඉදිරිපත් කිරීමේදී නිෂ්පාදන ගුණත්වය පිළිබඳව දැඩි සැලකිල්ලක් දැක්විය යුතුය. ආනයනකරුගෙන් - ආනයනකරුට, ඔවුන් බලාපොරොත්තු වන ගුණත්වයන් හා මට්ටම් වෙනස්වීමේ හැකියාවක් පවතී. විශේෂයෙන්ම, විදේශ වෙළඳපොළට නිෂ්පාදන සැපයීමේදී ඒ සඳහා යෙදවිය යුතු මූලික ප්‍රාග්ධනය ඉතා ඉහළ මට්ටමක වේ. පොලිතීන් ගෘහ තුළ හෝ සෙවන දැල් ආශ්‍රයෙන් පාලිත තත්ත්වයන් යටතේ වගාවන් සිදුකළ යුතුය. විශේෂයෙන්ම මල් නිෂ්පාදනයේ දී නම්, මල් වල ඒකාකාරී බව විශේෂ වැදගත්කමක් දරයි. මේ සඳහා ඉහළ තාක්ෂණික ක්‍රමෝපායයන් වෙත යාමට සිදුවෙයි. දිනෙන් දින වෙනස් වන, සීඝ්‍රයෙන් දියුණු වන විද්‍යාත්මක තාක්ෂණික වටපිටාව සමඟ අපනයන සඳහා ඉදිරිපත් කරන නිෂ්පාදන ද දියුණු විය යුතු වේ. එසේ නොවන්නේ නම් අපනයන වෙළඳපොළ තරඟකාරීත්වයට මුහුණ දීමේදී ගැටළුකාරී තත්ත්වයන් උද්ගත විය හැකිය.

මල් හා විසිතුරු පැළ අපනයනයට අදාළව ඉතා පැහැදිලි කරුණක් වන්නේ රෝපන ද්‍රව්‍ය වන බල්බ, කෝම, රෛසෝම හා ආකන්ද වැනි නිෂ්පාදන අපනයන වටිනාකම සාපේක්ෂව ඉතා පහළ අගයක් ගන්නා බවයි. එහි වාර්ෂික වටිනාකම 1994 වර්ෂයෙහි රුපියල් මිලියන 10ක පමණ මට්ටමක පැවතිය ද 2003 වනවිට රුපියල් මිලියන 0.06 ක මට්ටමකට පහළ බැස තිබේ. විශේෂයෙන්ම, ලාංකීය නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපොළ තුළ මෙම අංශයට පවතින ඉල්ලුම ක්‍රමයෙන් අඩුවීමත්, තරඟකාරී මට්ටමෙන් වෙනත් ඝර්ම කලාපීය රටවල් මෙම වෙළඳපොළට පිවිසීමත්, මෙකී අගයන් හි අඩුවීමට හේතු සාධක අතර සමහරකි. කෙසේ වුව ද, දැනට ශ්‍රී ලංකාව මෙම අංශයෙහි අපනයන සිදු කරන ප්‍රධාන රටවල් වන්නේ ජපානය, නෙදර්ලන්තය, එක්සත් රාජධානිය හා කැනඩාවයි. 2003 වසරේ මෙම අංශයෙන් වැඩිම වටිනාකමක් උපයාගෙන ඇත්තේ ජපානයෙනි. එය මෙම අංශයේ සමස්ථ වටිනාකමින් තුනෙන් එකක ප්‍රමාණයකි.

මල් සහ විසිතුරු පැළ අපනයන වටිනාකම් තුළ, සජීවී පැළ සඳහා හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. 1994 වසරේ දී රුපියල් මිලියන 162 ක් වූ සජීවී පැළ අපනයන ආදායම, 2003 වනවිට රුපියල් මිලියන 319 ක අගයක් දක්වා වර්ධනය වී තිබේ. එය ආසන්න වශයෙන් සියයට සියයක වර්ධනයකි. ශ්‍රී ලංකාව අපනයනය කරන ප්‍රධාන සජීවී පැළ වර්ග වන්නේ *ඩ්‍රැසේනා විශේෂ, ඇග්ලොනිමා විශේෂ, පොලිසියස් පෙනොකි (Polyscias Pennocki), පොලිසියස් බැල්ෆෝරියානා (Polysias balfouriana), ස්චෙෆ්ලෙරා ගෝල්ඩ් කැපෙලා සහ ට්‍රිනෙට් (Schefflera gold cpella & trinette), සැන්සෙවීරියා (Sansevieria), ෆිකස් (Ficus), සින්ඩැප්සස් ලයිම් (Scindapsus "lime"), ඩියුරන්ටා (Duranta), බැසඹූසා වුල්ගරිස් (Basmbusa Vulgaris), ඩයිසිගොතිකා (Dizygotheca), කෝඩියමම් (Codiaemum), සින්ගෝනියම් විශේෂ (Syngonium sps), පිලෙඩෙන්ඩ්‍රොම් විශේෂ (Philodendrom spp)* යනාදියයි. 2003 වසරෙහි සජීවී පැළ අපනයන අගයන් තුළ වැඩිම වටිනාකමක් ලබාගෙන ඇත්තේ ජපානයට කළ අපනයනයන්ගෙනි. එය සමස්ථ සජීවී පැළ අපනයන ආදායමෙන් 34% ක ප්‍රතිශතයකි. මීට අමතරව නෙදර්ලන්තය, ජර්මනිය, බෙල්ජියමයාව, දකුණු කොරියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉතාලිය, චීනය මෙන්ම එක්සත් රාජධානිය හා ඇමෙරිකා එක්සත් ජනපදය ද ශ්‍රී ලාංකික සජීවී පැළ ගැනුම්කරුවන් අතර ඉහළ මට්ටමක සිටී.

ශ්‍රී ලංකාව මල් සහ විසිතුරු පැළ ක්ෂේත්‍රය තුළ අපනයන කටයුතු ආරම්භ කළ මුල් අවදියෙහි

**සංඛ්‍යා සටහන :**

### ශ්‍රී ලංකාවේ කැපූ මල් නිෂ්පාදන අපනයන වටිනාකම් - 2000/2003

| නිෂ්පාදනය | 2000 | | 2001 | | 2002 | | 2003 | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය කි.ග්‍රෑ. | වටිනාකම රු. මි. | ප්‍රමාණය කි.ග්‍රෑ. | වටිනාකම රු. මි. | ප්‍රමාණය කි.ග්‍රෑ. | වටිනාකම රු. මි. | ප්‍රමාණය කි.ග්‍රෑ. | වටිනාකම රු. මි. |
| රෝස | 51247 | 13.77 | 100558 | 27.29 | 57264 | 17.42 | 20703 | 6.09 |
| කානේෂන් | 140478 | 47.00 | 114200 | 37.97 | 115986 | 38.03 | 83565 | 34.45 |
| ඕකිඩ් | 2589 | 10.27 | 720 | 1.23 | 641 | 1.18 | 572 | 0.72 |
| ඇන්තූරියම් | 3598 | 4.70 | 3570 | 3.10 | 10914 | 2.72 | 9536 | 2.04 |
| වෙනත් | 183760 | 66.6 | 188178 | 76.6 | 207212 | 90.8 | 154316 | 221.1 |
| **එකතුව** | **381673** | **142.3** | **407226** | **146.2** | **392017** | **150.2** | **268692** | **264.00** |

මූලාශ්‍රය : *ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය*

කැපූ මල් සඳහා සුවිශේෂී ස්ථානයක් හිමි විය. ඒ පිළිබඳව 1970 දශකයෙහි අපනයන සංඛ්‍යා ලේඛන වලින් පැහැදිලි වේ. කෙසේ වුවද, වර්තමානය වනවිට, කැපූ මල් සඳහා තිබූ ප්‍රමුඛස්ථානය අභිබවා යමින් සජීවී පැළ හා කැපූ අතු රිකිලි, ඉහළ අගයන් වාර්තාකර තිබේ. 2003 වසරේ අදාල අංශයේ සමස්ථ අපනයන ආදායමෙන් 28% කැපූ මල් අපනයන මඟින් ලබාගෙන ඇති බව වාර්තා වේ. ශ්‍රී ලංකාව ප්‍රධාන ලෙස අපනයනය කරනු ලබන කැපූ මල් වර්ග වන්නේ කානේෂන්, රෝස, ඇන්තුරියම්, ඕකිඩ් යනාදියයි. මේ අතරින් 2003 වසරේ වැඩිම අපනයන ආදායමක් ලබාගෙන ඇත්තේ කානේෂන් අපනයනය මඟිනි. එය රුපියල් මිලියන 34.45 ක අගයකි. අපනයන වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ රෝස සඳහා වැඩිම ඉල්ලුමක් ලැබී ඇත්තේ මැද පෙරදිග කලාපයෙනි. 2003 වසරේ රෝස සඳහා වූ අපනයන ආදායමෙන් 50% පමණ නියෝජනය වන්නේ සෞදි අරාබියාවෙනි. ඊට අමතරව සිංගප්පූරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව, ලෙබනන්, මාලදිවයින හා ජපානය ප්‍රමුඛ ගැනුම්කරුවන් වේ. කානේෂන් සඳහා ප්‍රධාන ගැනුම්කරු වන්නේ ජපානයයි. 2003 වසරේ ශ්‍රී ලංකාව කානේෂන් අපනයනයන්ගෙන් ලද ආදායමෙන් 97% පමණ සපුරාගෙන ඇත්තේ ජපානයෙනි. කානේෂන් අපනයනය කරන සෙසු රටවල් ලෙස ඕස්ට්‍රේලියාව හා සිංගප්පූරුව කැපී පෙනෙයි. මෑත වසරවල ඕකිඩ් අපනයනයෙන් වැඩිම ආදායමක් උපයාගෙන ඇත්තේ මාලදිවයිනෙනි. එම ප්‍රමාණය 2003 වසරේ ලැබූ ආදායමෙන් 66% ක ප්‍රමාණයකි. ශ්‍රී ලංකාව ඕකිඩ් අපනයනය කරන අනෙක් ප්‍රධාන රටවල් ලෙස එක්සත් රාජධානිය, ජපානය, කටාර්, පිලිපීනය හා නෙදර්ලන්තය දැක්විය හැකිය. ශ්‍රී ලංකාව කැපූ මල් අපනයනයට ප්‍රවේශ වූ මුල් කාලයේ ඒ තුළ ඇන්තුරියම් ප්‍රධාන තැනක් ගත්ත ද, වර්තමානයේ එම තත්ත්වයෙහි වෙනස් වීමක් පවතී. ඇන්තුරියම් අපනයන ආදායම වාර්ෂිකව ක්‍රමයෙන් අඩු වී ඇති බව ඉතා පැහැදිලිව පෙනේ. ඇන්තුරියම් සඳහා ප්‍රධාන ගැනුම්කරු වන්නේ ජපානයයි. 2003 වසරේ ඇන්තුරියම් අපනයන ආදායමෙන් 87% සපුරාගෙන ඇත්තේ ජපානයෙනි. සෞදි අරාබිය, කටාර්, ප්‍රංශය, බහරේන්, මාලදිවයින, ඕස්ට්‍රේලියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය වැනි රටවල් මෙරට ප්‍රධාන ගැනුම්කරුවන් වේ.

ශ්‍රී ලංකාවේ කැපූ මල් අපනයන ආදායම එනම් ප්‍රධාන වර්ග වන රෝස, කානේෂන්, ඕකිඩ් හා ඇන්තුරියම් යන වර්ගයන්හි අපනයන ආදායම් පසුගිය වසර වලට සාපේක්ෂව ක්‍රමික අඩුවීමක් වාර්තා වේ. සමස්ථ අගය ඉහළ යාම කෙරෙහි ඉහත සඳහන් වර්ග වලට අමතරව අනෙකුත් වර්ග වලින් දැක්වූ දායකත්වයෙහි වැඩිවීම බලපා තිබේ. විශේෂයෙන්ම, මල් කලඹ හා විවිධ සැරසිලි අවශ්‍යතා සඳහා ගැලපෙන කැපූ මල්, මල් පොහොට්ටු ආදියෙහි අපනයන අගයන් ක්‍රමිකව වැඩිවීමක් ද පෙන්නුම් කෙරෙයි.

මෑත කාලීනව අපනයන ආදායම් තුළ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අංශයක් ලෙස කැපූ කොළ සහ අතු රිකිලි (Foliage) දැක්විය හැකිය. මල් සහ විසිතුරු පැළ අපනයන අංශයෙහි ආංශික වශයෙන් වැඩිම දායකත්වයක් දක්වන්නේ ද මෙම අංශයයි. 2003 වසරේ සමස්ථ අපනයන වටිනාකමින් 37% කට මෙම අංශය දායක විය. නෙදර්ලන්තය, ජපානය, එක්සත් රාජධානිය, ජර්මනිය, ඉතාලිය, ප්‍රංශය, මැද පෙරදිග රටවල් සහ ස්විට්සර්ලන්තය, පෝලන්තය, දකුණු කොරියාව යන රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැනුම්කරුවන් වේ. දැනට ඉහළ ඉල්ලුමක් පවතින කැපූ කොළ හා අතුරිකිළි වර්ග ලෙස *ඩ්‍රැකේනා සැන්ඩ්‍රියානා ගෝල්ඩ් සහ වයිට් (Draceana Sandriana Gold & White), කේන් පාම් (Cane Palm), ක්රෝටන් (Croton), මොන්ස්ටෙරා (Monestera), කෝඩිලයින් (Cordyline) පොතොස් (Pothos) කැලතීඅ (Calathea), කැරියෝටා (Cariota), මිස්කැන්තස් (Miscanthus), ලිවිස්ටෝනියා පාම් (Livistonia Palm), රැෆිෂ් පාම් (Raphis Palm), ඇස්පාරගස් (Asparagas)* ආදිය දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ මල් සහ විසිතුරු පැළ නිෂ්පාදනයන් හි සමස්ථ අපනයන වටිනාකම් වාර්ෂිකව ඉහළ නැගුන ද, ලෝක වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවට හිමි ස්ථානය ක්‍රමයෙන් අඩු වී යන බව පෙනේ. විශේෂයෙන්ම, යුරෝපයට කැපූ මල් සපයන යුරෝපයට පිටත රටවල් අතර 1991 වසරේදී නව වන ස්ථානය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණි. කෙසේ වුව ද, මෙම තත්ත්වය ක්‍රමයෙන් පහළ යමින් වර්තමානය වන විට 42 වන ස්ථානය දක්වා අඩු වී තිබේ. මෙය තවදුරටත් අඩු වීමේ ප්‍රවණතාවයක් ද පවතී. මේ සඳහා ප්‍රබල හේතුවක් වී ඇත්තේ තරඟකාරී මට්ටමේ අනෙකුත් රටවල් ලෝක වෙළඳපොළ සීඝ්‍රයෙන් ආක්‍රමණය කිරීමයි. ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව වැනි රටවල් ක්‍රමයෙන් ලෝක වෙළඳපොළ ආක්‍රමණය කිරීමක් දක්නට ලැබෙන අතර එය ශ්‍රී ලංකාවේ අපනයන සම්බන්ධයෙන් දැඩි තර්ජනයකි.

## මල් සහ විසිතුරු පැළ ආනයන අංශය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල වාර්තා වලට අනුව, 2003 වසරේ දී ශ්‍රී ලංකාව රුපියල් මිලියන 46ක් මල් සහ විසිතුරු පැළ වර්ග ආනයනය සඳහා වැය කර තිබේ. ආනයන සංයුතිය ද, අපනයන සංයුතිය මෙන්ම ප්‍රධාන අංශ හතරකට වෙන් කොට විමසා බැලීමේදී ඉන් ශ්‍රී ලංකාව වැඩිපුරම ආනයනය කර ඇත්තේ සජීවී පැල වර්ග බැව් පෙනේ. එය සමස්ත ආනයන වලින් 62% ක ප්‍රමාණයක් නියෝජනය කරයි. නෙදර්ලන්තය, ජර්මනිය, බෙල්ජියම, ඉතාලිය, ප්‍රංශය, ජපානය, එක්සත් ජනපදය යන රට වලින් ප්‍රධාන ලෙසම සජීවී පැල ආනයනයන් සිදුවෙයි.

ආනයන සංයුතිය තුළ දෙවන වැදගත් ස්ථානය හිමිවන්නේ කැපූ මල් අංශයට වන අතර එය 2003 වසරේ සමස්ථ ආනයන වියදමින් 23% නියෝජනය කරයි. රෝස ආනයනයේ දී මැලේසියාව හා සිංගප්පූරුව ප්‍රමුඛව සිටින අතර 2003 වසරෙහි රෝස ආනයනය කිරීමක් දක්නට නොලැබේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල වාර්තා වලට අනුව, 2000 වසරෙන් පසුව ඕකිඩ් ආනයනයක් ද සිදුවී නොමැත. අනෙකුත් නැවුම් මල් වර්ග ආනයන කරන ප්‍රධාන රටවල්

වන්නේ මැලේසියාව, නෙදර්ලන්තය, ඉන්දියාව, ජර්මනිය, තායිවානය යන රටවල් ය. කැපූ කොළ හා අතු - රිකිලි ප්‍රධාන ලෙසම මියන්මාර්, මැලේසියා, හොංකොං, ජර්මනිය, ඉන්දියාව, තායිලන්තය වැනි රට වලින් ආනයනය කරන අතර 2003 වසරේ මල් හා විසිතුරු පැළ අංශයේ සමස්ථ ආනයන වටිනාකමින් 13% මෙම අංශය නියෝජනය කරයි. බල්බ, රෛසෝම, ආකන්ද ආදී ප්‍රජනන ද්‍රව්‍ය, සෙසු අංශ සමඟ සැසඳීමේ දී ආනයන වටිනාකම් පහළ මට්ටමක පවතින අතර ප්‍රධාන ලෙසම නෙදර්ලන්තය, ඊජිප්තුව, චීනය හා එක්සත් රාජධානිය යන රට වලින් ආනයනය සිදු වේ.

මල් හා විසිතුරු පැල කර්මාන්තය, ප්‍රධාන ලෙසම පෞද්ගලික අංශය මූලිකවම කටයුතු කරන කර්මාන්තයකි. මෙහි දී, ශ්‍රී ලාංකීය මල් සහ විසිතුරු පැල කර්මාන්තය සතු ශක්තීන්, දුර්වලතා, අවස්ථාවන් සහ අභියෝග සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය.

## ශ්‍රී ලාංකීය මල් සහ විසිතුරු පැල කර්මාන්තය සතු ශක්තීන්

### දේශගුණික තත්ත්වයන්,

ශ්‍රී ලංකාවේ සෑම කෘෂි පාරිසරික කලාපයකම ඉතා පහසුවෙන් වසර පුරා වගා කටයුතු සිදු කිරීම සඳහා ගැලපෙන දේශගුණික වාතාවරණයක් පවතී. මෙය ලොව සෙසු රටවල් සමඟ සැසඳීමේදී නිෂ්පාදන පිරිවැය පහත හෙළීම සඳහා ශ්‍රී ලංකාව සතු වූ ඉතා අගනා අවස්ථාවකි. මෙසේ වසර පුරා අඛණ්ඩව වගා කටයුතු සිදුකළ හැකි රටවල් ලෝකයේ ඇත්තේ ඉතා සීමිත ප්‍රමාණයකි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ විවිධ වූ කෘෂි පාරිසරික තත්ත්වයන් යටතේ ඝර්ම කලාපීය හා සෞම්‍ය කලාපීය වශයෙන් පවත්නා සෑම වර්ගයකම වගාවන් සිදුකිරීමේ හැකියාව පවතී. එය ලෝක වෙළඳපොළ තරඟකාරීත්වයට මුහුණ දීමේදී ඉතා ඉහළ වැදගත්කමක් උසුලනු ලබන්නකි.

### සාපේක්ෂ වශයෙන් අඩු ශ්‍රම හා කළමනාකරණ පිරිවැය :

අනෙකුත් රටවල් සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවේ ශ්‍රම පිරිවැය පහළ මට්ටමක පවතින අතර කර්මාන්තය තුළට පිවිසීමට කැමති පිරිසක්ද හඳුනාගත හැකිය. විශේෂයෙන්ම, මල් හා විසිතුරු පැල කර්මාන්තය, සාපේක්ෂව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අනෙකුත් වගාවන්ට වඩා ඉහළ තාක්ෂණික ක්‍රමෝපායයන් භාවිතා කරමින් සූක්ෂම මට්ටමෙන් කළ යුත්තකි. මේ සඳහා කර්මාන්තයට ප්‍රවේශවන්නන්ගේ බුද්ධිමත් බව ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව සතුව සාක්ෂරතාවයෙන් ඉහළ රැකියා විරහිත තරුණ පිරිසක් සිටී. මෙය කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ඉතා වැදගත් වූවකි.

### භූගෝලීය පිහිටීම

ශ්‍රී ලංකාව, ලෝකයේ මල් සහ විසිතුරු පැළ සඳහා විශාල ඉල්ලුමක් පවතින ප්‍රධාන කලාපයක් වන යුරෝපය, මැද පෙරදිග හා ආසියාවේ රටවල් සඳහා ඉතා පහසුවෙන් ගුවනින් හා මුහුදින් ළඟාවිය හැකි ආකාරයේ පිහිටීමකින් යුක්ත දිවයිනකි. මෙකී සෑම ප්‍රධාන වෙළඳපොළකටම පැය 12-24 අතර කාල පරාසයක දී අපනයන සැපයීමේ හැකියාව ශ්‍රී ලංකාව සතු වේ.

### ඉතා වටිනා දේශීය ශාක විශේෂ පැවතීම

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් ඉතා ඉහළ ඉල්ලුමක් පවතින ශාක විශේෂ වලින් ඉතා පොහොසත් මට්ටමක පසු වේ. මෙකී දේශීය විශේෂ මත පදනම්ව විවිධාකාරයේ නව ප්‍රභේද බිහිකිරීමේ හැකියාව ඉහළ මට්ටමක පවතින අතර එය සාපේක්ෂව වෙනත් රටවල් සතු නොවන විශාල සම්පතකි.

### රෝපන මාධ්‍ය

සජීවී පැල අපනයනයේ දී, ඒ සඳහා රෝපන මාධ්‍යයක් ලෙස පස් භාවිතා කිරීමට බොහෝ දුරට ආනයනය කරන රටවල් අවසර ලබා නොදෙයි. ශ්‍රී ලංකාවේ ඉතා පහසුවෙන් ලබාගත හැකි කොහුබත් යුරෝපය හා ජපානයේ නිරෝධායන දෙපාර්තමේන්තු මඟින් අනුමත කර තිබේ. මෙය අපනයන කර්මාන්තයේ දී ශ්‍රී ලංකාව සතු විශාල ශක්තියකි.

### ගැටළු හා බාධක

මල් හා විසිතුරු පැල කර්මාන්තය සම්බන්ධයෙන් 1997 වසරේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද සමීක්ෂණයකට අනුව, එවකට කර්මාන්තය මුහුණ දී සිටි ගැටළු හා බාධක කිහිපයක් ද, ඒ සඳහා විසඳුම් යෝජනා ද ඉදිරිපත් කොට තිබුණි. එකී සමීක්ෂණය සිදුකර දැනට වසර අටක් පමණ ගත වී ඇති අතර ඉන් හඳුනාගත් සමහර ගැටළු මේ වනවිටත් ඒ ආකාරයෙන්ම පවතින බව කර්මාන්තය සම්බන්ධයෙන් නිරීක්ෂණය කර බැලීමේදී පැහැදිලි වේ. දේශීය වෙළඳපොළ පෙරටු කොට ගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මෙන්ම අපනයන මූලික කොටගත් මහා පරිමාණ කර්මාන්තකරුවන් ද වර්තමානය වනවිට විවිධ ගැටළු හා බාධක වලට මුහුණදෙන බව ඔවුන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා වලින් ඉතා පැහැදිලි වේ.

දේශීය වෙළඳපොළ තුළ ප්‍රධාන අලෙවි මධ්‍යස්ථානයක් වන විහාර මහා දේවි උද්‍යානයේ දී 2005.02.25 වන දින කළ සමීක්ෂණයකට අනුව, සුළු හා මධ්‍ය පරිමාණ වගාකරුවන් මේ වනවිට මුහුණ දෙන ප්‍රධාන ගැටළුකාරී තත්ත්වයන් කිහිපයක් හඳුනාගත හැකිවිය. එසේම අපනයන ක්ෂේත්‍රය තුළ ඉතා ප්‍රචලිත ආයතනයක් වන මයික් ෆ්ලෝරා ආයතනය හා තවත් අපනයන හා සම්බන්ධ ආයතන මෙන්ම

ක්ෂේත්‍රයට සම්බන්ධ අපනයන සංවර්ධන මණ්ඩලය ආදී විවිධ ආයතන සමඟ ද වත්මන් තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීමේදී පවතින තත්ත්වය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගත හැකි විය. ඒ අනුව, කර්මාන්තය වර්තමානයේ මුහුණදෙන ගැටළු පහත දැක්වෙන පරිදි සාරාංශ කළ හැකි වේ.

i. වගා ව්‍යාප්තිය සඳහා සුදුසු ඉඩම් නොමැතිකම
ii. යෙදවුම් ද්‍රව්‍යවල හා උපකරණවල මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම
iii. රෝපන ද්‍රව්‍යවල හිඟය හා නව වර්ග හඳුන්වාදීමේ ප්‍රමාදයන්
iv. අලෙවි මධ්‍යස්ථානයක් නොමැතිකම
v. කර්මාන්තය සම්බන්ධ තොරතුරු ලබාගැනීමේ අපහසුතාව
vi. ඉහළ තාක්ෂණික ක්‍රමෝපායයන් සම්බන්ධ පුහුණුවීම් මද බව
vii. රෝපන මාධ්‍ය සම්බන්ධ ගැටළු (ගඟේ වැලි සහ කොහුබත් මිල ගණන් ඉහළ යාම)
viii. කෘෂි උපදෙස් හා ව්‍යාප්ති සේවාවන් හි පවතින දුර්වලතා
ix. විශේෂිත කෘමි නාශක හා පොහොර වර්ග ලබාගැනීමේ ගැටළුව
x. නව වෙළඳපොළවල් වලට ප්‍රවේශවීම් ප්‍රමාණවත් නොවීම
xi. ඉහළ ගුවන් ගාස්තු, ඉඩකඩ සීමාවීම්, ශීතාගාර දුෂ්කරතා
xii. සහතික කිරීම් හා බලපත්‍ර ලබාගැනීමේ දී පවතින දුෂ්කරතා

මෙවන් ගැටළුකාරී තත්ත්වයන් පැවතීම ශ්‍රී ලාංකීය මල් සහ විසිතුරු පැල කර්මාන්තය අභියෝගයකට ලක්වීමකි. විශේෂයෙන්ම ඉන්දියාව, චීනය, තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව වැනි රටවල් ඉතා වේගයෙන් ලෝක වෙළඳපොළ ආක්‍රමණය කරමින් සිටී. එකී රටවල රජයන් විවිධ පහසුකම් වැඩි වශයෙන් මෙම අංශයට ලබාදීමක් දක්නට ලැබේ. තව ද, මහා පරිමාණ වාසි මත පදනම් වෙමින් ඒකක පිරිවැය අඩු කර ගැනීමට ද, මෙම රට වලට හැකියාව ලැබී තිබේ. මෙය ලෝක වෙළඳපොළ තරඟකාරීත්වයේ දී, ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට අනාගතයේදී මුහුණදීමට සිදුවන ප්‍රබල තර්ජනයක් වනු නොඅනුමානය. ඒ පිළිබඳව ද දැඩි අවධානයක් යොමුකිරීම කාලෝචිත ය.

මල් හා විසිතුරු පැල කර්මාන්තය දේශීය වෙළඳපොළ තුළ මෙන්ම විදේශීය වෙළඳපොළ තුළ ද මේ දක්වා දිගු දුරක් ගමන්කර ඇති අතර ඉදිරියේ දී එහි ශක්තීන්, විභවතාවයන් නිවැරදිව හඳුනා ගනිමින් දේශීය ආර්ථිකයට විශාල මෙහෙවරක් කිරීමේ හැකියාව පවතී. සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු, විවිධ ගැටළු හා බාධක වලට මැදිව පවත්නා අතර එහි දී පිරිවැය ඉහළ යාම් හා අලෙවිය පිළිබඳ ගැටළු නිරන්තරයෙන් මතු වේ. එහි අවසන් ප්‍රතිඵලය සාම්ප්‍රදායික ගොවිතැනින් ගොවීන් ක්‍රමයෙන් ඈත් වීමයි. මේ සඳහා විකල්පයක් ලෙස යම්තාක් දුරට මෙවැනි අංශයන් ආදේශ කළ හැකි ය. ඒ තුළින් ග්‍රාමීය රැකියා වියුක්තියට යම් පිළියමක් ලබා ගැනීමට ද පුළුවන. මේ අංශයෙන් විමසන විට මල් හා විසිතුරු පැල වගාව සඳහා රට තුළ ඉහළ විභවතාවයක් පවතින බව පෙනේ. ගැටළුව ඇත්තේ එය නිවැරදිව හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය ආයතනික රාමුව මෙන්ම අනෙකුත් පහසුකම් නිවැරදි දිශාවකට යොමුවන්නේ ද යන්නයි. එසේ වුවහොත් ලාංකීය මල් හා විසිතුරු පැල කර්මාන්තයට දේශීය වශයෙන් මෙන්ම විදේශීය වෙළඳපොළ තුළ ද යහපත් කලක් උදාවනු නොඅනුමානය.

## ගොවි ජනතා - ඉදිරි කලාප.....

- කෘෂි කාර්මික අලෙවිකරණය
- කිරි සහ කිරි ආශ්‍රිත කර්මාන්ත
- කාබනික ගොවිතැන

ඉහත තේමාවන් යටතේ ලියැවෙන ලිපි සඳහා ඔබට ද දායක විය හැකිය. ඔබගේ ලිපි ඒ 4 තනි පිටුවෙහි ලියා පහත සඳහන් ලිපිනයට අප වෙත ලැබෙන්නට සැලැස්විය හැකිය.

**සංස්කාරක**
**ගොවිජනතා,**
**ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකය,**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**
**114, විජේරාම මාවත,**
**කොළඹ 07.**